**ජාතික ඔලිම්පික් කමිටුව - 2021**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය

ජතික ඔලිම්පික් කමිටුවේ ("කමිටුව") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කමිටුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කමිටුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කමිටුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, කමිටුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කම්ටුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කම්ටුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කමිටුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කමිටුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.14,920,228ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.19,329,390ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,409,162 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ක්‍රියාකාරී වියදම් රු. 46,700,534 කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ක්‍රීඩා සම්මේලන දෙකකින් ලැබිය යුතු ගිණුම් වටිනාකම රු. 986,847 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක සිට අයකරගෙන නොතිබුණි. | මෙම ශේෂට අයකරගැනීමට හෝ සම්මේලන දෙකෙහි වාර්ෂික ප්‍රදානයන්ගෙන් අඩුකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ප්‍රතිපාදන ලබාදීමට හෝ ප්‍රවර්තන වර්ෂය තුළදී එම වටිනාකම ලියා හැරීමට හැකියාවක් නොමැත. | ලැබිය යුතු ගිණුම් ශේෂයන් අයකර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | රු. 435,374 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු තුනක ශේෂය වර්ෂ හතරක කාලයක සිට පියවා නොතිබුණි. | සටහනි කර තන්නා ලද අතර මෙය වර්ෂ 4ක සිට නොපියවා පවතී. ප්‍රවර්තන වර්ෂය තුළ අදාළ ගැලපීම් සිදුකිරීමට කටයුතු කරමු. | ශේෂය පියවීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රීඩා කටයුතු සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සූදානම් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ජාත්‍යාන්තර ඔලිම්පික් කමිටුව විසින් රු. මිලියන 4.5ක මුදලක් ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුව වෙත ලබා දී තිබුණි. කෙසේ වෙතත්, කමිටුව විසින් එය ඉහත කාර්යය සඳහා යොදා | ක්‍රීඩාවේ අනාගත සංවර්ධනය උදෙසා 2021 දෙසැම්බර් මාසයේදී මෙම අරමුදල් ලැබුණි. කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම අරමුදල් උපයෝජනය නොකළ අතර මේ වනවිට සුදුසු ව්‍යාපෘති | මෙම අරමුදල ක්‍රීඩක ක්‍රීඩිකාවන් සීදානම් කිරීම හා සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොගෙන එය විලම්බිත ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පරීක්ෂා කරමින් සිටිමු. සම්මලෙනයේ නිර්දේශ අනුව මේ වනවිට අප විසින් ක්‍රීඩක ක්‍රීඩාකාවන්ට අරමුදල් සැපයීම සඳහා දත්ත විශ්ලේෂණය කරමින් පවතී. | |
| (ආ) | 2019 වර්ෂයේ දකුණු ආසියානු ක්‍රීඩා උළෙල අවසානයේදී නේපාල ඔලිම්පික් කමිටුව විසින් 13 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ අලෙවිකරණ කොටස් වශයෙන් රු. මිලියන 13.1 ක මුදලක් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව වෙත ලබා දී තිබුණි. මුදලි ලැබී වර්ෂ දෙකකට අධික කාලයක් ගතවී ඇතත්, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් එම අලෙවිකරණ කොටස කිසිදු ක්‍රීඩා සංවර්ධන වැඩසටහනක් සඳහා භාවිතා කර නොතිබුණි. | ලද අරමුදල් නිශ්චිත වැඩසටහනක් සඳහා භාවිතා කිරීමට සැලසුම් කර ඇති බැවින් විලම්බිත ආදායම් ලෙස පවත්වාගෙන ඇත. කොවිඩ් 19 තත්ත්වය හා පසුව ඇතිවූ ආර්ථික අර්බුදය සමඟ සියගුම වැඩසටහන් වෙනස්වීමට ලක්විය. අප විසින් මෙම අරමුදල් නිශ්චිත වැඩසටහනක් සඳහා භාවිතා නොකරන්නේ නම්, විගණන විමසුම්වලින් ආරක්ෂා වීම සඳහා මෙය නැවත සාමාන්‍ය ආදායමට ලියා හැරීමට අප විසින් කටයුතු කරනු ඇත. | එම අරමුදල ඕනෑම ආකාරයේ ක්‍රීඩා සංවර්ධන වැඩසටහනක් සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කමිටුව සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | ජාතික ඔලිම්පික් කමිටුව විසින් සිය කාර්ය මණ්ඩලය ඵලදායී ලෙස පවත්වා ගැනීම සඳහා අවධානය යොමු කරමින් මනා කළමනාකරණයක් සිදුකරයි. | ඵලදායී මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා බඳවා ගැනීම් යෝජනා ක්‍රමයක් සකස් කර අනුමැතිය ලබාගත යුතුය. |

**4. වගවීම හා යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කමිටුව විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | අප ලාභ අපේක්ෂාවෙන් කටයුතු කරන ආයතනයක් නොවන අතර ඉදිරි වර්ෂය සඳහා බලාපොරොත්තු වන මෙහෙයුම් කටයුතු අපගේ වාර්ෂික අයවැය/ ඇස්තමේන්තු මත ක්‍රියාත්මක වේ. | කමිටුවේ අනාගත දිශානතිය පෙන්නුම් කරන ආයතනික සැලැස්ම සකස් කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂය සඳහා නියමිත කාලසීමාවන් තුළ ළඟා කරගත හැකි ඉලක්ක හා අරමුණු ඇතුළත් අනුමත ක්‍රියාකාරී සැලැස්මක් කමිටුව විසින් සකස් කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2014 යටතේ අප පාලනය නොවේ. කෙසේ වෙතත්, වර්ෂය තුළ සියලු ක්‍රියාකාරකම් ඇතුළත් සවිස්තරාත්මක අයවැයක් වර්ෂය ආරම්භයට පෙර අනුමත කර ඇති අතර ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් කළයුතු සියලුම ක්‍රියාකාරකම් සඳහා විධායක කමිටුව විසින් මෙය ඉලක්කයන් වශයෙන් භාවිතා කර ඇත. සියලුම ක්‍රියාකාරකම් ඇතුළත් සවිස්තරාත්මක අයවැයක් අප සතුව ඇත. | කමිටුවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |